# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 36 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 සැප්තැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 4.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

**2007 අංක 36 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 18 වන දින]

එල්. ඩී.–ඕ. 18/2007.

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 36 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇඇ) ජාතික වැසි ජල ප්‍රතිපත්තියට සහ 8අ වගන්තිය ප්‍රකාරව පිළියෙල කරනු ලැබූ සංවර්ධන සැලැස්මෙහි ඇතුළත් කිරීමට නියමිත උපක්‍රමයන්ට අනුකූලව වැසි ජලය එක්රැස් කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම";.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ 4 වන අයිතමයේ (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

"(ඉ) වැසි ජලය එක්රැස් කිරීම සඳහා අවශ්‍ය පියවර සැලසීම සහ පරිශ්‍රයේ සහ වහලයේ ජලාපවහනය";.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.